**පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සබරගමුව**

විෂය - චිත්‍ර කලාව

සතිය - 09

ශ්‍රේණිය - 6

සැකසුම - තමාලි පරණගම

මාවනැල්ල අධ්‍යාපන කලාපය

**නිපුණතාවය :-** 4.0 නිෂ්පාදන හා සේවා අවශ්‍යතා සඳහා ග්‍රැෆික් චිත්‍ර නිර්මාණය කරයි.

**නිපුණතා මට්ටම :-** 4.2 ව්‍යවහාරික හා සන්නිවේදන අවශ්‍යතා සඳහා සිදුරු තහඩු ක්‍රමය භාවිත කරයි.

**ක්‍රියාකාරකම :-** ආගමික උත්සවයක් පදනම් කරගෙන සුභපැතුම් පතක් නිර්මාණය කරන්න.

ඔබ මේ වන විටත් පසුගිය පාඩම්වලින් ආගමික උත්සව පිළිබඳ ඉගෙන ගෙන ඇත. එම ආගමික උත්සව පිළිබඳ අවබෝධයෙන් පහත පියවර අනුගමනය කරමින් ක්‍රියාකාරකම්වල නිරත වන්න.

**පියවර :-**

01. අවශ්‍ය උපකරණ සපයාගන්න. (කතුරු, පේපර් කටර්, වර්ණ, බුරුසු, පින්සල්, ස්පොන්ච් කැබැල්ලක්, පනාවක්, සුභපැතුම් පත නිර්මාණයට අවශ්‍ය සුදු පැහැති A4 කොළයක්, කාඩ්බෝඩ් )

02. A4 කොළය දෙකට මැදින් නවා පෙරළීමට හැකි පරිදි සකසා ගන්න.

03. ඔබ විසින් සපයාගෙන ඇති කාඩ්බෝඩ් කොටසේ ඔබ කැමති ආගමික උත්සවයක් සඳහා සුදුසු රූපයක අච්චුවක් කපා ගන්න. පහතින් දැක්වෙන්නේ නත්තල් උත්සවය සඳහා කාඩ්බෝඩ් කැබැල්ලක් මත කපා ගත් අච්චුවකි.



04. දැන් ඔබ නවාගත් A4 කොළයේ පළමු පිටුවේ මෙම අච්චුව තබා රතු, කොළ, සුදු/ලානිල්, දුඹුරු වැනි වර්ණ ස්පොන්ච් කැබැල්ල ආධාරයෙන් හෝ බුරුසුවට වර්ණ ගෙන පනාවේ පිරිමැදීමෙන් හෝ වර්ණ කරන්න.

05. පසුව අච්චුව ඉවත් කරන්න.

06. අක්ෂර හැඩ භාවිතා කර සුබ පැතුම් පත අලංකාර කර ගන්න.

07. පහත ඡායාරූප බලන්න.






